---

**සංශෝධනයයි**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,469 හා 2025.12.26 දිනැති *ගැසට්* පත්‍රයේ පළ කර ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025 හි අයදුම්පත් කැඳවීමේ නිවේදනය සඳහා පහත සංශෝධන ඇතුළත් කරනු ලබන අතර එම නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026.02.20 දින පැය 21:00**ට අවසන් වේ.

සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනය **2026.01.23** දින ලෙස නොවෙනස්ව පවතී.

6.2 අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

| *අනු. අංක* | *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *සුදුසුකම්* |
|---|---|---|---|---|
| 03 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 01 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්,<br><br>(*අ*) භෞතික විද්‍යාව හෝ ගණිතය පිළිබඳ විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (පුහුණු කාලය හැර) වසර 15ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;<br><br>*හෝ*<br><br>(*ආ*) භෞතික විද්‍යාව සහ ගණිතය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (පුහුණු කාලය හැර) වසර 15ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 03 (I) | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | කාලගුණ විද්‍යාඥ | 02 | (*අ*) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම;<br><br>*හෝ*<br><br>(*ආ*) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත වීම. |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 ජනවාරි මස 21 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

01 - 341

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.